# දකුණු දිග වියළි කලාපයේ කුරක්කන් වගාව හා එය දියුණු කිරීම

කේ. කේ. පෙරේරා
(පර්යේෂණ නිලධාරි)
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.

උද්භිද විද්‍යාත්මකව එලියුසිනා කොරකානා (එල්) ගයත්‍රන් ලෙස හඳුන්වන කුරක්කන් බෝගය අප්‍රිකාව, ඉන්දියාව, උගන්ඩාව, සුඩානය ආදී රට වල වගා කරනු ලබයි. ලංකාවේ එය වියළි කලාපයට සීමාවූ බෝගයක් ලෙසට ඈත අතීතයේ සිට වගා කරගෙන එයි. කුරක්කන් ධාන්‍ය ආහාරය ලෙස ගනී. මෙම ධාන්‍ය පිටිකර රොටී, හැලප, කේක්, පුඩිං ආදී කෑම වර්ග පිළියෙල කිරීමට සහ නොමේරූ කරල් එළවළුවක් ලෙස භාවිතා කළ හැක.

බීජවල පෝෂණ සංයුතිය දෙස බලන විට එහි ප්‍රෝටීන සියයට 6–11 දක්වා ප්‍රමාණයක් ඇති අතර සුදු බීජ සහිත ඉන්දීය වර්ගවල සියයට 14 පමණ වාර්තා වී තිබේ. ඇමයිනෝ අම්ල ගැන සලකන විට සිස්ටීන්, ට්‍රයසීන්, ට්‍රිප්ටොෆේන් සහ මෙතයනීන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇති නමුත් එහි ලයිසීන් ප්‍රමාණය අඩුය. මෙම බීජවල කැල්සියම් ප්‍රමාණය අනෙක් බොහෝ ධාන්‍ය වලට වඩා වැඩිය. තවද බීජවල වැඩි යකඩ සහ පොස්පරස් ප්‍රමාණයක් අඩංගුය.

කුරක්කන් බීජවල පෝෂණ සංයුතිය

| සංඝටකය | ප්‍රතිශතය |
|---|---|
| ජලය | 13.0 |
| ප්‍රෝටීන | 8.0 |
| මේදය | 1.3 |
| කාබෝහයිඩ්රේට | 72.0 |
| තන්තු | 3.0 |
| අළු | 2.7 |

(ජොන්සන් සහ රේමන්ඩ් 1964)

මෙම බෝගයට කුරුල්ලන්ගෙන් වන හානිය ඉතාමත්ම අඩු අතර ගබඩා කිරීමේදී ද ධාන්‍ය ගුල්ලන්ගෙන් හානියක් සිදු නොවෙයි. තවද එහි ප්‍රරෝහණ ප්‍රතිශතය සතුටුදායක ලෙස බොහෝ කලක් රඳවාගත හැකිය.

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය සහ රත්නපුර, මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක වලින් කොටස්ද අඩංගු වන ලෙස දකුණු දිග වියළි කලාපය සැකසී ඇත. ඉහත දැක්වූ දිස්ත්‍රික්ක වලින් දැනට කුරක්කන් බෝගය වැඩිපුරම වගා කරනුයේ මොණරාගල සහ හම්බන්තොටය, රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු ප්‍රමාණ වශයෙන් වගා කරනු ලබයි.

**ගොවීන් වගා කරන ආකාරය:**

ප්‍රධාන වශයෙන් කුරක්කන් බෝගය මහ කන්නයට සීමාවූ බෝගයක් ලෙසට මෙම කලාපයේ වගාකරනු ලැබේ. වාරි ජල පහසුකම් ඇත්නම් වාරි ජලය යටතේ යල කන්නයේදී ඉතා සුළු වශයෙන් වගා කරයි. කෙසේ වෙතත් රත්නපුර දිස්ත්‍රික්කයේ අන්තර් මාධ්‍ය කලාපයේ යල කන්නයේදී එම ප්‍රදේශයේ ඇති දේශීය කුරක්කන් ප්‍රභේද අහස් දිය තත්වය යටතේ සතුටුදායක ලෙස වැවෙයි.

වගාකිරීම සඳහා බොහෝ විට දේශීය ප්‍රභේද භාවිතා කරයි. හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල දින 110-115 ක් පමණ වයස් වන දේශීය ප්‍රභේද ප්‍රධාන ලෙස ව්‍යාප්තවී තිබේ. කෙසේ වෙතත් රත්නපුර දිස්ත්‍රික්කයේ අන්තර් මාධ්‍යය කලාපයේ දින 90 ක් පමණ වන දේශීය ප්‍රභේද ද වගාකරනු ලබයි. තවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රභේදය වන එම්. අයි. 302 ඉතා සුළු වශයෙන් ව්‍යාප්තව ඇති ආකාරයක් නිරීක්ෂණය කරන්නට ලැබෙයි.

හේන් වගාවක් ලෙසට සීමාවී ඇති කුරක්කන් බෝගය තනි බෝගයක් ලෙසට වගා කරයි. තවද බඩ ඉරිඟු, අබ වැනි බෝග සමඟ මිශ්‍ර බෝගයක් ලෙසට වගාකර තිබෙයි. ප්‍රධාන වශයෙන් වැපිරීම කරනු ලැබුවත් හම්බන්තොට මොණරාගල දිස්ත්‍රික්කවල සුළු වශයෙන් වුවද දියුණු වගා ක්‍රම වන පේළියට බීජ දැමීම සහ පැල සිටුවීම භාවිතා කර තිබෙන අවස්ථා නිරීක්ෂණය කර තිබේ.

හේන් වගා කිරීමේදී කරනුයේ කැලයක් කපා පුළුස්සා වල් පැල වලින් තොර අළු සහිත බිමක් ලබා ගැනීමයි. මෙවැනි හේනක් නව දැලි හේනක් ලෙස හඳුන්වයි. මෙවැනි නව දැලි හේනක අළු මතුපිටට හෙක්ටාරයකට කුරක්කන් බීජ කිලෝ 5-15 අතර ප්‍රමාණයක් මුල් වැසිත් සමඟ වැපිරීම කර උදැල්ලක භාවිතයෙන් පස් යටකිරීම කරති. මෙලෙස හේනෙහි කන්නයන් කීපයක් වගා කරයි. සමහර ගොවීහු තමන් විසින් සාදා ගන්නා ලද මාකරයක් මගින් සෙ. මී. 30 ක පරතරයක් සිටින ලෙස බීජ ඉතා තුනී ලෙස තැන්පත් කරන අතර වැඩි පැල ඉවත් කිරීම සංස්ථාපනය වීමෙන් පසුව කරති.

කුරක්කන් වගාවක වල්පැල මර්ධනය ඉතා වැදගත් නිසා ගොවීන් කරනු ලබන්නේ අවස්ථා කිහිපයකදී එනම් වපුරා දින 15, 30, 45 දී වල් පැල උදුරා ඉවත් කරනු ලැබීමය. තවද වී වගාවට වල් නාශක භාවිතාව ක්‍රමයෙන් වැඩි කිරීමත් සමගම මෙම බෝගයටද වල් නාශක භාවිතය පටන් ගෙන තිබේ. මෙහිදී හම්බන්තොට දිස්ත්‍රික්කය සලකන විට කුරක්කන් වගාවේ වල් පැල මර්ධනයට එම්. සී. පී. ඒ. වල් නාශකය දින 20 කදී පමණ භාවිතයට පුරුදුවී තිබෙන බවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයෙන් අසන්නට ලැබෙයි.

කුරක්කන් වගාවන්ට දැනට රසායනික පොහොර භාවිතා නොකෙරේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ මෙම බෝගය ප්‍රධාන ලෙස වගා කරන්නේ නවදැලි හේන්වල වීමය.

දේශීය ප්‍රභේදයන් මෙම කලාපයේ මූලික ලෙස වගා කරනු ලබන නිසා ඒවා රෝග සහ පලිබෝධ වලට ප්‍රතිරෝධීතාවයක් ඇත. මෙම නිසා ගොවීන්ට කුරක්කන් වගාවකදී රෝග සහ පලිබෝධ මර්ධනයට විශේෂ උනන්දුවක් දැක්වීම අවශ්‍ය නොවෙයි.

මෙම කලාපයේ වගාකරන ප්‍රභේද සිටුවීමේ සිට අස්වැන්න නෙලීම දක්වා දින 90 - 115 ක පමණ කාලයක් ගතවෙයි. මෙය වගා කරන ප්‍රභේදය අනුව තීරණය වෙයි. අස්වැන්න නෙලීම අවස්ථා කීපයකදී කරන අතර අස්වැන්න දැකැති වලින් කපා ගොඩගසා තබනු ලබයි. ඊට දින 3 - 4 කට පසුව කරල් වලින් බීජ වෙන්කරනු ලබයි.

මෙලෙස මෙම කලාපය තුළ වගා කරන ගොවීන්ගේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටාරයකට කිලෝ 800 - 1000 අතර වෙයි. මෙම නිසා මෙම අඩු අස්වැන්න වැඩි කිරීම ඉතා වැදගත්ය.

කුරක්කන් බෝගය දියුණු කිරීම.

දැනට පවතින ප්‍රභේදයන් වෙනුවට වැඩි අස්වනු ගෙන දෙන ප්‍රභේදයන් වැඩි දියුණු කිරීමෙන් සහ උසස් සහ ගොවීන්ට පහසුවෙන් අනුගමනය කළ හැකි ශස්‍ය විද්‍යාත්මක ක්‍රම හඳුන්වා දීමෙන් කුරක්කන් වගාව දියුණු කළ හැකි බවක් පෙනෙයි.

(අ) ප්‍රභේද වැඩි දියුණු කිරීම.

මෙම බෝගය වැඩි දියුණු කිරීමේ සැලැස්මකදී අස්වැන්න, සමාකාර කරල් මේරීම, ඇද වැටීමට ප්‍රතිරෝධීතාවය, බෝගයේ වර්ධන කාල සීමාව සහ රෝග සහ පලිබෝධ වලට දක්වන ප්‍රතිරෝධතාව දියුණු කිරීම අවශ්‍යයෙන්ම කළ යුතුය.

1. අස්වැන්න

බෝගයක් වැඩි දියුණු කිරීමේ සැලැස්මකදී අස්වැන්න ගැන සැලකීම ඉතා වැදගත්ය. වෙනත් බෝගයකට මෙන්ම කුරක්කන් බෝගයටද වැඩි අස්වැන්නක් ලබා ගැනීම අපගේ අරමුණයි. හේන් ගොවියාගේ මට්ටමේදී ලබාගන්නා අස්වැන්න ඉතාමත් අඩු අතර එය හෙක්ටාරයකට කිලෝ 800 - 1000 අතර පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන එම්. අයි. 302 ප්‍රභේදය බොහෝ දේශීය ප්‍රභේදයන්ට සමානතාවයක් දක්වන අතර එය පර්යේෂණ තත්වයන් යටතේදී හෙක්ටාරයකට කිලෝ 1000 - 1500 යන සාමාන්‍ය අස්වැන්නක් වාර්තාකර ඇත. කුරක්කන් බෝගයේ අස්වැන්න වැඩි කිරීමේ සැලැස්මකදී අවම වශයෙන් හෙක්ටාරයකට කිලෝ 2000 ක අස්වැන්නක් බලාපොරොත්තු විය යුතුය.

මෙලෙස ගොවීන්ගේ මට්ටමේදී අඩු අස්වැන්නක් දැක්වීමට එක් හේතුවක් වන්නේ ගොවීන්ට ඉතා දියුණු වැඩි අස්වැන්නක් ගෙන දෙන ප්‍රභේද නොමැති නිසාය. ඔවුන් ළඟ තිබෙන සමහර දේශීය වර්ග පවා ප්‍රභේද කිහිපයක මිශ්‍රිත වර්ගයන්ය.

හිටපු කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයකු වන ආචාර්ය සී. ආර්. පානබොක්ක මහතාගේ විශේෂ උනන්දුව නිසා ඉන්දීය වැඩි දියුණු වර්ග ගෙන්වා අත්හදා බැලීම් කරගෙන යන ලදී. මෙහිදී පෙනී ගිය කරුණක් නම් ඉන්දීය ප්‍රභේදයන් දේශීය කුරක්කන් ප්‍රභේදයන්ට සහ නිර්දේශිත එම්. අයි. 302 ප්‍රභේදයට වඩා වැඩි අස්වැන්නක් ලබා දෙන බවය. තවද සමහර ආදර්ශක වලදී දියුණු කරන ලද සමහර ප්‍රභේද හෙක්ටාරයකට කිලෝ 4000 කට වඩා වැඩි අස්වනු වාර්තාගත වී ඇත.

මහ කන්නයන් කිහිපයක කුරක්කන් ප්‍රභේද කිහිපයක සාමාන්‍ය අස්වැන්න

| ප්‍රභේදය | අස්වැන්න (හෙ. කි. ග්‍රෑම්) |
|---|---|
| CO 10 | 2487 |
| PR 202 | 2708 |
| JNR 3B 1008 | 2720 |
| HPB 83-4 | 2374 |
| දේශීය වර්ග | 1223 |
| MI 302 | 1162 |

යල කන්නයන් කිහිපයක කුරක්කන් ප්‍රභේද කිහිපයක සාමාන්‍ය අස්වැන්න (හෙ. කි. ග්‍රෑ.)

| ප්‍රභේදය | අස්වැන්න |
|---|---|
| HPB 83 – 4 | 2813 |
| JNR 3B 1008 | 2717 |
| CO 10 | 2351 |
| දේශීය වර්ග | 1502 |

2. සමාකාර කරල් මේරීම.

සමාකාර කරල් මෝරන ප්‍රභේදයන් ගොවීන්ට හඳුන්වාදීම ඉතා වැදගත්ය. එසේ නැතහොත් අවස්ථා කිහිපයකදී අස්වනු නෙලීම සිදුකිරීමට සිදු වෙයි. මෙම නිසා වැඩිපුරම කම්කරු ඒකක ගණනක් යෙදවීමට සිදුවෙයි. කෙසේ වෙතත් දැනට තිබෙන කුරක්කන් ප්‍රභේදවල හටගන්නා කරල් මේරීම අසමාකාර අන්දමින් සිදුවෙයි. නමුත් ඉහතින් පෙන්වා දෙන ලද ඉන්දියානු වර්ග බොහෝ දුරට සමාකාරය.

මෙම නිසා හොඳ ප්‍රභේදයක් තෝරා ගැනීමේදී පාමුල කරල් වැඩි ද්විතීයක කරල් අඩු ප්‍රභේදයක් තෝරා ගැනීම වැදගත්ය. එවිට එකම අවස්ථාවක මෝරනු ලබන කුරක්කන් වගාවක් ලබාගත හැක.

3. ඇද වැටීමට ප්‍රතිරෝධිතාවය.

ඇද වැටීමට ප්‍රතිරෝධී බව කුරක්කන් අභිජනන වැඩ සටහනක ඉතා වැදගත් වෙයි. කුරක්කන් බෝගය ඇද වැටුන හොත් අස්වැන්න නෙලා ගැනීම අපහසු වන අතර මේ සඳහා අමතර කම්කරු ඒකක ගණනක් යෙදවීමට සිදුවෙයි.

දැනට හඳුන්වා දී තිබෙන එම්. අයි. 302 සහ දේශීය ප්‍රභේදයන් බොහෝ දුරට ඇද වැටීමට ප්‍රතිරෝධිතාවයක් දක්වයි. නමුත් මීට ඉහත දී සඳහන් කරන ලද ඉන්දීය ප්‍රභේදයන් ඇද වැටීමට පාත්‍ර වෙයි.

4. බෝගයේ වර්ධන කාල සීමාව.

මහ කන්නය සලකන විට දින 90 – 105 ක ප්‍රභේදයක්ද යල කන්නය සලකන විට දින 75 - 90 වක ප්‍රභේදයක්ද අවශ්‍ය බව පෙනෙයි. කෙසේ වෙතත් දැනට තිබෙන බොහෝ දේශීය වර්ග සහ එම්. අයි. 302 ප්‍රභේදය දින 105 ඉක්මවයි.

5. රෝග පලිබෝධ ප්‍රතිරෝධී බව :

රෝග සලකන විට වී වගාවේදී වැළඳෙන කොළපාළු රෝගය කුරක්කන් වගාවටද වැළඳෙයි. නමුත් මෙම රෝගය ඉතා දරුණු අන්දමින් පැතිරීම දක්නට නැත. කොළපාළු රෝගය පත්‍රවලට සහ කරලෙහි නටුවට හානි කරනු ලබයි. පත්‍රවල හට ගත් විට පත්‍රවල දුඹුරු පුල්ලි හටගැනීම සිදුවන අතර කරලෙහි නටුවෙහි හටගත් විට කරල කඩා වැටෙන අතර එය ගෙල කුණුවීම ලෙස හඳුන්වති. තවද ගෙල කුණුවීම නිසා කරල්වල බීජ හටගැනීම සහ බීජ පිරීම අඩු කරයි. පත්‍රවලට ආසාදනයේදී පත්‍ර මතුපිට දින 30 කදී පමණ පුල්ලි හටගැනීම දක්නට ලැබෙන අතර ඊට ටික දිනකට පසුව මෙම තත්වය මඟහැරී යයි. දේශීයව වගාකරන වර්ග මෙම රෝගයට ප්‍රතිරෝධිතාවයක් දක්වතත් ඉන්දීය වර්ග මෙයට පාත්‍රතාවයක් දක්නට ලැබෙයි.

පලිබෝධ හානි සලකන විට කඳ පණුවාගේ හානිය දක්නට ලැබෙන අතර දේශීය ප්‍රභේද වලට මෙම හානිය ඉතා අඩුය. ඉන්දීය වර්ගවල හානිය වැඩිය. මෙම හානිය සිදුවූ පඳුරු වලින් කරල් හටගන්නේ නැත. පලිබෝධ හානිය දරුණුව හටගත් විට ශාකඳ මැලවී සිදුරුවී යයි.

එම නිසා අභිජනන සැලැස්මකදී කොළපාළු රෝගයට සහ කඳ පණු හානියට ප්‍රතිරෝධ බව වර්ග අභිජනනය කිරීමේදී සලකා බැලිය යුතුය.

**(ආ) දියුණු ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම භාවිතය:**

ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මගින් බෝගයේ අස්වැන්න වැඩි දියුණු කිරීමේදී බිම සැකසීම, නියමිත පැල ඝනත්වය, පැල සංස්ථාපනය කිරීම, පොහොර යෙදීම සහ වල් පැල මර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

**1. බිම සැකසීම:**

බීජ ඉතා කුඩා නිසා ඉතා හොඳ බිමක් සකස් කිරීම ඉතා වැදගත්ය. ගොවීන් බොහෝ විට වගා කරනුයේ නවදැලි හේන්වලය. මෙහිදී බීජ අළු සමඟ මිශ්‍රවන අතර පැලවීමද හොඳින් සිදුවෙයි. නැතහොත් ඉතා හොඳින් බිම සැකසීම කළයුතුය.

**2. නියමිත පැල ඝනත්වය:**

නියමිත පැල ඝනත්වයක් තබාගැනීම වැදගත්ය. මෙමගින් ප්‍රාථමික කරල් සහ ද්විතීයික කරල් ඇති වන ප්‍රමාණයන් තරමක් පාලනය කරගත හැකි නිසා මේරීම එකම අවස්ථාවක සිදුවීමෙන් අස්වැන්න නෙලීම එකම අවස්ථාවක කරගත හැකිය. තවද නියමිත පැල ඝනත්වය මගින් වල් මර්ධනයට පහසු කරවයි. එක තැන ඝනට පැල තිබෙන්නේ නම් වැඩි පැල ඉවත්කර තුනී කිරීම වැදගත් වෙයි.

**3. පැල සංස්ථාපනය කිරීම:**

හේන් වගාවේදී කරනු ලබන්නේ වැපිරීමයි. නමුත් පේළියට බීජ දැමීම සහ පැල සිටුවීම මගින්ද සාර්ථක ප්‍රතිඵල නෙලාගත හැක. පේළියට බීජ දැමීමේදී පේළි අතර සෙ. මී. 30 පමණ පරතරයක් සිටින ලෙස මාකරයකින් බීජ දමා පැල සෙ. මී. 3–4 ක් පමණ උස්වන විට පැල අතර සෙ. මී. 15 ක පරතරයක් තබා පැල තුනී කිරීමෙන් සාර්ථක වගාවක් ලබාගත හැක. බීජ පසට එකතු කිරීමේදී කුඩක් ලෙස ඇති පලිබෝධ නාශකයක් යොදන්නේ නම් වැදගත්ය. මෙයට හේතුව වන්නේ වියළි පසට බීජ එකතු කරන විට හෝ ටික දිනක් පස වියළි තත්වයෙන් තිබෙන විට හෝ කුඩා සතුන්ගෙන් වන හානි අඩුකර ගැනීමටය. මෙසේ නැතහොත් ක්ෂේත්‍රයේදී අසමාන ආකාරයට සංස්ථාපනය වූ කුරක්කන් වගාවක් ඇතිවෙයි. මෙවිට අපට පැල අතර නියමිත පරතරයක් ලබාදීමට අපහසු වෙයි. කෙසේ වෙතත් නවදැලි හේන් වලදී හොඳාකාර පොළොවෙහි අළු දක්නට ලැබෙන නිසා සතුන්ගෙන් වන හානි ඉතාමත් අඩුය. තවද පැල සංස්ථාපනය සඳහා මව් කරල් වලින් ලබාගත් බීජ යොදගැනීම ඉතා හොඳය.

පැල සිටුවීම සලකන විට ඒ සඳහා තවානමක් හොඩ තවානක් සකසා ගත යුතුය. මෙවැනි තවානක පැල දින 18 – 27 පමණ කාලයක් තිබෙන්නට හැර වැස්සකට පසුව හෝ පස තෙත්ව ඇතිවිට අවශ්‍ය ක්ෂේත්‍රයේ පැල සිටුවීම මගින් සාර්ථක ඒකාකාර කුරක්කන් වගාවක් ලබාගත හැක.

**4. පොහොර භාවිතය.**

කුරක්කන් බෝගය කාබනික සහ රසායනික පොහොරට ඉතා හොඳින් ප්‍රතිචාරයක් දක්වන බව සඳහන් වෙයි. කෙසේ නමුත් නව දැලි හේන් වලදී පස සාරවත් බවින් වැඩි නිසා පොහොර යෙදීම අනවශ්‍ය වුවත් එම හේනෙහි ඊට පසුව එන කන්නවලදී පොහොර යෙදීම උසස් අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍යය. මේ සඳහා මූලික පොහොරක් ලෙස හෙක්ටාර් එකකට යූරියා කිලෝ 15, සාන්ද්‍ර සුපර් පොස්පේට් කිලෝ 48 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ 45 ක් අඩංගු වන මිශ්‍රණයක් යෙදීම හොඳය. තවද සති 3 – 4 කට පසුව හෙක්ටාරයකට යූරියා කිලෝ 47 ක් මතුපිට පොහොර ලෙස යෙදිය යුතුය.

**5. වල්පැල මර්ධනය.**

කුරක්කන් වගාවක මුල් අවස්ථාවේදී වල්පැල මර්ධනය ඉතා වැදගත්ය. දැනට තිබෙන පර්යේෂණ දත්තයන් අනුව පෙනී ඇත්තේ ගොවීන් විසින් වපුරන ලද වගාවක් සඳහා දැනට භාවිතා කරනු ලබන දින 15, 30, 45 දී වල් පැල උදුරීම සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන බවය. තවද වපුරන ලද වගාවක් සඳහා පළල් පත්‍ර සහ තෘණ වර්ග මර්ධනයට 40% ඇම්. සී. පී. ඒ. වල් නාශකය හෙක්ටාරයකට ලීටර් 1 – 2 දක්වා ප්‍රමාණයක් දින 20 කදී යෙදිය හැකි බව පර්යේෂණ අනුව පෙනී ඇත. මීට අමතරව පේළියට වගා කරන ලද වගාවක වල්පැල දින 15 සහ දින 30 දී ඉවත් කිරීම වැදගත්ය.

ඉහත කරුණු අනුව අවසාන වශයෙන් සඳහන් කළහැක්කේ දක්ෂිණ දිග වියළි කලාපය සඳහා වැඩි අස්වැන්නක් ගෙනදෙන, සමාකාරව මේරීම සිදුවන ඇද වැටීමට භාජනය නොවන, රෝග සහ පලිබෝධ ප්‍රතිරෝධී මහ කන්නය සඳහා දින 90–105 ක වර්ධන කාලයක් ඇති සහ යල කන්නය සඳහා දින 75–90 ක වර්ධන කාලයක් ඇති කුරක්කන් ප්‍රභේද හඳුන්වා දිය යුතු බවය. මේ අතර බිම සැකසීම, නියමිත පැල ඝනත්වය පවත්වා ගැනීම, පැල සංස්ථාපන ක්‍රම, පොහොර භාවිතය සහ වල් පැල මර්ධනය ආදිය ක්‍රමවත්ව කිරීම මගින් අස්වැන්න වැඩි කිරීමට ගොවීන් දිරි ගැන්විය යුතුය.